## කැළණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

### දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර)-2019

2025 - ජූලි

**BCOME 2063 - විගණනය**

ප්‍රශ්න සංඛ්‍යාව : (පහයි) 05 කාලය : පැය 03 යි

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

---

### ප්‍රශ්න අංක 01

මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේ අවශ්‍යතාවය ප්‍රධාන වශයෙන් නෛතික අවශ්‍යතා සහ නියෝජ්‍යත්ව න්‍යාය (agency theory) මත පැන නැගේ.

අ) මූල්‍ය ප්‍රකාශන විගණනයේ නෛතික අවශ්‍යතාවය සැකවින් පහදන්න.

(ලකුණු 05)

ආ) විගණන අපේකෂා ඉදුරමහි (Audit expectation gap) සංරචක තුන සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

ඇ) විගණන ගිවිසුමක් හා සම්බන්ධ කරමින් සහතික කරන ගිවිසුමක මූලිකාංග සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

### ප්‍රශ්න අංක 02

අ) විගණන අවදානම ප්‍රමාණාත්මක අවප්‍රකාශන අවදානම සහ හෙළිදරව් අවදානම අතර ශ්‍රිතයකි.ඔබ මෙම වගන්තිය සමඟ එකඟවන්නේ ද? පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ) විමසීම්, විශ්ලේෂණාත්මක ක්‍රමවේද සහ නිරීක්ෂණ යන තාක්ෂණික මෙවලම් භාවිතයෙන් විගණන අවදානම් තක්සේරු පටිපාටීන් සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

ඇ) විගණන ගිවිසුමක සමස්ථ තත්ත්ව ආරක්ෂණය සම්බන්ධ වගකීම විගණන හවුල්කරු සතුවේ.

i. විගණන ගිවිසුමක තත්ත්ව ආරක්ෂණය ලඟා කර ගැනීමට අවශ්‍ය ප්‍රධාන අවශ්‍යතාවය ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 04)

ii. විගණන කණ්ඩායමේ සාමාජිකයන්ගේ මෙන්ම විගණන ගිවිසුමට අදාල අනෙකුත් විශේෂඥයන්ගේ නිපුණතා සහ හැකියාවන් පිළිබඳව ගිවිසුම් හවුල්කරු තක්සේරු කොට තෘප්තිමත් වන්නේ කෙසේද?

(ලකුණු 06)

**(මුළු ලකුණු 20)**

## ප්‍රශ්න අංක 03

විගණන පටිපාටි නිර්මාණය කිරීමේදී, තම විගණන පටිපාටින්හි අරමුණු ලඟා කර ගැනීම සඳහා ප්‍රමාණාත්මක සහ ගුණාත්මක විගණන සාක්ෂි සම්පාදනය කර ගැනීමට පරීක්ෂණ කිරීමට අයිතම තෝරා ගැනීමට සුදුසු ක්‍රම විගණක තීරණය කල යුතුය.

අ) විගණක සාක්ෂි සම්පාදනය කර ගැනීමට පරීක්ෂණ කිරීමට අයිතම තෝරා ගැනීම සඳහා විගණකවරයෙකු සතු ක්‍රම කවරේ ද?

(ලකුණු 03)

ආ) නියැදි ප්‍රමාණය තෝරා ගැනීමේදී විගණකවරයෙකු සලකා බැලිය යුතු සාධක කවරේ ද?

(ලකුණු 03)

ඇ) විගණක නියැදියට අදාලව පහත දෑ පහදන්න.

i. දරාගත හැකි දෝෂය (Tolerable error)

ii. අපේක්ෂිත දෝෂය (Expected error)

(02 x ලකුණු 03 = 06)

ඈ) බාහිර විගණන ක්‍රියාවලියකදී වංචාවක් හෙළිදරව් වූ විට විගණකවරයෙකු විසින් ගතයුතු සුදුසු ක්‍රියා මාර්ග මොනවා ද?

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

## ප්‍රශ්න අංක 04

ත්‍රි ස්ටාර් (පුද්ගලික) සමාගමේ 2024 / 2025 වර්ෂය සඳහා ඔබ විගණන කළමණාකරු ලෙස කටයුතු කරයි. ඔබ ආයතනයේ විගණන හවුල්කරු විසින් මෙම විගණනයට අවශ්‍ය විගණන උපාය මාර්ගය සහ විගණන සැලැස්ම පිළියෙල කරන ලෙස ඔබට දන්වන ලදී.

අ) විගණන සැලැස්ම සමස්ථ විගණන උපායමාර්ගයෙන් වෙන්කොට දක්වන්න.

(ලකුණු 02)

ආ) ත්‍රි ස්ටාර් (පුද්ගලික) සමාගම් විගණනයේ සැලසුම් අවධියේදී ඔබ විසින් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන මූලික සැලසුම් ක්‍රියාකාරකම් ලැයිස්තුගත කරන්න.

(ලකුණු 04)

ඇ) විගණක ක්‍රියාපටිපාටි පිළියෙලකිරීමේදී විගණකවරයෙකුට භාවිතා කල හැකි මූල්‍ය ප්‍රකාශන මිණුම් දඬු (Financial statement assertions) හඳුනාගන්න.

(ලකුණු 06)

ඈ) ශේෂ පත්‍ර දිනට පවතින දේපල පිරියත සහ උපකරණ ශේෂයන් සත්‍යාපනය කිරීම සඳහා සුදුසු විගණන ක්‍රියාවලියක් සකසන්න.

(ලකුණු 08)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

පහත දෑ සැකවින් පහදන්න.

අ) තහවුරු පරීක්ෂාව (Substantive procedures)

ආ) පරීක්ෂාව සහ සත්‍යාපනය (Vouching and Verification)

ඇ) මූල්‍ය ප්‍රකාශන විගණනයේ අරමුණ (The objective of an audit of financial statements )

ඈ) ලේඛණගත කිරිම (Documentation )

(05 x [illegible] 04 = 20)
**(මුළු ලකුණු 20)**